# <u>පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ දීය.</u>

**අභියාචනා අංක AAT/13/2020 (NPC)**

බණ්ඩාරගේ විමල්සිරි රත්නායක,

**<u>අභියාචක</u>**

**<u>එදිරිව,</u>**

**ජාතික පොලිස් කොමිෂන් සභාව**

<u>වගඋත්තරකරු</u>

**ඉදිරියේ දී :- විනිසුරු කේ.ටී.චිත්‍රසිරි (සභාපති)**

**ජේ.ජේ.රත්නසිරි (සාමාජික)**

**එස්.නන්දසේකරන් (සාමාජික)**

**දිනය - 2025.01.30**

පෙනී සිටීම :-

අභියාචක වෙනුවෙන් - නීතිඥ පී.කේ.ප්‍රින්ස් පෙරේරා මහතා

ජාතික පොලිස් කොමිෂන් සභාව වෙනුවෙන් - ආර්.එම්.එස්.පී.රත්නායක මහතා, නියෝජ්‍ය අධ්‍යක්ෂක,

## <u>නියෝගය</u>

**ජේ.ජේ.රත්නසිරි මහතා - සාමාජික පරි.අභි.විනි.අධි**

ඉහත අභියාචක බණ්ඩාරගේ විමල්සිරි රත්නායක, ඔහුගේ 2020.01.06 දින දරණ අභියාචනය මඟින් දන්වා සිටින්නේ, තමා 1999.05.23 ශ්‍රී ලංකා පොලිස් සේවයේ ආධුනික පොලිස් කොස්තාපල්වරයෙක් ලෙස සේවයට බැදී 2000.02.06 දින විශේෂ කාර්ය බලකායට බැදී සටන් පුහුණු පාඨමාලාව හැදෑරූ බවත්, ඉන්පසුව දිවයිනේ විවිධ ප්‍රදේශවල සේවය කරමින් සිට 2014.04.23 දින සිට විශේෂ කාර්ය බලකා අරලියගහ මන්දිරයේ කඳවුරට අනුයුක්තව සිටි බවය. එසේ සිටියදී 2016.12.07 දින සිට 2016.12.14 දින දක්වා විවේක හා ගමන් කිරීමේ

නිවාඩු ලබා ඔහුගේ නිවස පිහිටි නොච්චියාගම නිවසට පැමිණි බවය. එසේ පැමිණ නිවාඩු මත සිටියදී නොච්චියාගම පොලිස් වසමේ අමුණුකොලේදී සිදුවුවා යැයි කියන සිද්ධියක් මත 2016.12.13 දින වැඩ තහනමට ලක්ව සිටි බවත් ය.

මෙසේ වැඩ තහනම් ව සිටියදී 2017.05.21 දින ඒ වැඩ තහනම ඉවත් කර නැවත සේවයට වාර්තා කරන ලෙස දැනුම් දීමක් ලද බවයි. ඒ අනුව සේවයට වාර්තා කිරීමට යාම සඳහා අවශ්‍ය මුදලක් ලබා ගැනීම සඳහා තම ඥාතියෙකුගේ නිවසට යමින් සිටියදි තවත් පුද්ගලයින් තිදෙනෙක් සමඟ නොච්චියාගම මහේස්ත්‍රාත් අධිකරණය ඉදිරියේ දී ඇතිවූ යම් සිදුවීමත් මත නොච්චියාගම පොලීසිය මඟින් අත් අඩංගුවට ගෙන නොච්චියාගම මහේස්ත්‍රාත්තුමා වෙත ඉදිරිපත් කිරීමෙන් පසුව රක්ෂිත බන්ධනාගාර ගත කළ බවත් ය.

ඉන්පසුව මෙම සිද්ධිය සම්බන්ධව විශේෂ කාර්ය බලකා සහකාර පොලිස් අධිකාරී ආර්.එම්.විමලරත්න විසින් මූලික විමර්ශනයක් පවත්වා ඇත. අදාළ විමර්ශන වාර්තාව අනුව නියෝජ්‍ය පොලිස්පති විශේෂ කාර්ය බලකා මඟින් චෝදනා පත්‍රයක් ලබාදි ඇත. (ඇමුණුම A1)

එම චෝදනා පත්‍රය STF/HRMD/DI 61/2017 හා 2017.08.30 ලෙස සටහන් කර ඇත. චෝදනා ලෙස

I. අපකීර්තිදායක හැසිරීම

II. අපකීර්තිදායක හැසිරීම

මේ අනුව අදාළ චෝදනා පත්‍රයට අනුව විධිමත් විනය පරීක්ෂණයක් පවත්වා, එහි තීරණ මත අදාළ චෝදනා දෙක සඳහාම වැරදිකරු ලෙස තීරණය කර අංක C/STF/0510794/2018 හා 2018.05.07 දින (ඇමුණුම් A2) විනය නියෝගය ලබාදී ඇත. එම විනය නියෝගය අනුව පොලිස් සැරයන් තනතුරේ සිට පොලිස් කොස්තාපල් තනතුර දක්වා තනතුර පහත හෙළීමක් කර ඇත.

එම තීරණයන්ට එරෙහිව අභියාචක 2018.08.09 දින (ඇමුණුම් A3) ජාතික පොලිස් කොමිෂමට ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති අතර, ජාතික පොලිස් කොමිසම ඔවුන්ගේ අංක NPC/APDIS/246/2018 හා 2019.12.04 දින ලිපියෙන් එය ප්‍රතික්ෂේප කර ඇත.

එම තීරණයෙන් අතෘප්තියට පත් අභියාචක 2020.01.06 දින මෙම අධිකාරය වෙත අභියාචනයක් ඉදිරිපත් කරමින් පහත සහනයන් සළසා දෙන ලෙස ඉල්ලා ඇත.

ආ.

I. විනය නියෝගය ඉවත් කරන ලෙසත්,

II. ජාතික පොලිස් කොමිෂමේ තීරණය ඉවත් කරන ලෙසත්,

III. අභියාචක චෝදනාවලින් නිදොස් කර නිදහස් කරන ලෙසත්,

IV. 2016.12.13 – 2017.05.21 දක්වා වූ කාලයට සියළු හිඟ වැටුප් ලබාදීමට නියෝග කරන ලෙසත්,

ඇ. සාජන් තනතුරේ තැබීමට නියම කරන ලෙසත්,

ඈ. ගරු අභියාචනා විනිශ්චය සභාවට සුදුසු හා උචිත යැයි හැගෙන වෙනත් සහ වැඩිමනත් සහනයන් ලබාදෙන ලෙස.

මෙසේ ඉල්ලා සිටීමට හේතු වශයෙන් අභියාචක ඔහුගේ නීතිඥ මගින් 2024.12.03 ඉදිරිපත් කරන ලද ලිඛිත සංදේශයේ පහත කරුණු ඉදිරිපත් කර ඇත.

I. අභියාචකට එරෙහිව පැවති විනය පරීක්ෂණයේ දී මහජන නියෝජිතයින් දෙදෙනෙක් සහභාගී වී නැත. ඒ අනුව පොලිස් නිලධාරියකුට විරුද්ධව කරන පරීක්ෂණයකදී සිදුකරන මූලික අවශ්‍යතාවක් ඉටුවී නැති බව.

II. අභියාචකට එරෙහිව පැවති චෝදනා ශක්‍යතා වැඩිබර නැමැති උපමානය මත ඔප්පු කර නැත.

III. අභියාචකට එරෙහිව පැවති අධිකරණ නඩු දෙකෙන්ම ඔහු නිදහස් කර ඇති බව.

ජාතික පොලිස් කොමිසම මඟින් 2023.12.29 දින හා NPC/AAT/13/2020 (NPC) අංක දරණ ලිපිය මඟින් ඔවුන්ගේ නිරීක්ෂණ ඉදිරිපත් කර ඇත. එසේම ජාතික පොලිස් කොමිසම 2020.07.23 දින හා AAT/13/2020 (NPC) අංක දරණ ලිපිය මඟින් ද නිරීක්ෂණ වාර්තා ඉදිරිපත් කර ඇත. අදාළ ලිපියේ 8:2:3 ඡේදය අනුව ශිරෝමි අජන්තා කුමාරි රාජපක්ෂ නැමැති අයට ලිංගික අතවර කිරීමේ සිද්ධියක් මත නියෝජ්‍ය පොලිස්පති විශේෂ **කාර්ය** බලකා ගේ අංක STF/D/PMSD/TT/2243/2016 හා 2016.11.13 ලිපිය මඟින් අභියාචක වැඩ තහනමට ලක්වී ඇත. ඒ සම්බන්ධව ගත් ක්‍රියාමාර්ග පිළිබඳ ව පැහැදිලි තොරතුරු මෙම ගොනුවේ සඳහන් නොවේ.

එසේ තිබිය දී 2017.05.23 දින අභියාචක නැවත සේවයේ පිහිටුවීම සඳහා නියෝග ලබා දී ඇත. එසේ වුවත් මෙම සිදුවීම මත නැවත එම සේවයේ පිහිටුවීම අවලංගුකර C/STF/03/1954/2017 හා 2017.06.09 දින දරණ ලිපිය මඟින් නැවත වැඩ තහනමකට ලක්කර ඇත.

අදාළ ගොනුව පරීක්ෂා කිරීමේ දී මෙම අභියාචකට එරෙහිව අධිකරණයේ නඩු දෙකක් පැවති බව පෙනේ.

I. අංක 49061 යටතේ නොච්චියාගම මහේස්ත්‍රාත් අධිකරණයේ 2016.12.12 දින ශිරෝමි අජන්තා කුමාරි රාජපක්ෂ නැමැති අයට ඇයගේ කැමැත්තෙන් තොරව නිවසට ඇතුළුවීම හා බලහත්කාරයෙන් පැමි යටතේ නඩු පවරා ඇත. අදාළ පැමිණිලි පාර්ශවය සමඟ සමථයකට පත්වීම යටතේ 2018.09.20 දින

අපරාධ නඩු විධාන සංග්‍රහයේ 266-4 යටතේ අභියාචක එම නඩුවෙන් නිදහස් කර ඇත. (ඇමුණුම X.2)

II. අංක 47931 යටතේ තඹුත්තේගම මහේස්ත්‍රාත් අධිකරණය දෙවෙනි නඩුව පවරා ඇත. 2017.05.21 දින ප.ව.6.30ට පමණ නොච්චියාගම අධිකරණ භූමියට අයුතු ඇතුළුවීම හා අධිකරණ ආරක්ෂක සිසිර කුමාර යන අයට පහරදීම හා බැනවැදීම යන චෝදනා යටතේ එය පවරා ඇත.

මෙම නඩුව අභියාචක ඇතුළු තවත් 03 දෙනෙකුට විරුද්ධව පවරා ඇත. එහිදී අනික් චූදිතයින් තිදෙනා සමථ මණ්ඩලයේදී රු.40,000/- වන්දියක් අදාළ පැමිණිලිකරුට ලබාදී සමථයට පත්වී ඇත. 2017.11.26 දින ලිපිය (ඇමුණුම් 8) මඟින් ඒ බව තහවුරු වේ.

මෙම අභියාචක සමථ මණ්ඩලයේ දී මෙම සමථ සිද්ධියේ දී එකඟ වී නැති අතර. 2021.03.09 දින චෝදනා ඔප්පු නොවීම මත අධිකරණයෙන් නිදහස් කර ඇත. එසේම මෙම නඩු තීන්දුවේ චූදිතගේ නමේ වෙනසක් තිබීම මත නැවත 2021.08.20 දින එය සංශෝධනය කරගෙන ඇත. ඇමුණුම X.1 මඟින් එය සනාථවේ.

මුල් කරුණට අදාළව අභියාචක විසින් අංක AAT/61/2019 (NPC) යටතේ මෙම අධිකාරයට අභියාචනයක් ඉදිරිපත් කර ඇත. එම අභියාචනය මඟින් විනය නිලධාරී විසින් ලබාදී ඇති වැටුප් වර්ධක එකක් විලම්භනය යන්න වෙනුවට ජාතික පොලිස් කොමිෂම විසින් එය වැටුප් වර්ධක එකක් වසරක් අත්හිටුවීම දක්වා අඩුකර ඇති දඬුවම ඉවත් කරන ලෙස ඉල්ලා ඇත. ඒ පිළිබඳව තීරණයක් තවම ලබාදී නැත.

මෙම අභියාචක සම්බන්ධයෙන් ගොනුව අධ්‍යයනයේදී, මෙම කරුණට අදාළ මූලික විමර්ශනය පැවැත්වූ විශේෂ කාර්ය බලකායේ සහකාර පොලිස්

අධිකාරී විමලරත්නගේ මූලික විමර්ශන වාර්තාව අනුව (ඇමුණුම 1) අදාළ සිද්ධියට මුහුණ දුන් උඩුපිලගේ සිසිර කුමාර යන අයගේ ප්‍රකාශය වැදගත්වේ.

**"පසුව තුසිත මල්ලී තමයි කිව්වේ ඒ දෙන්නා ගෙන් මුලින් මට ගහපු කෙනා සරත් කියලයි. අනික් කෙනා සංක කියලයි. ඊට පස්සේ ඔවුන් දෙදෙනා ගියා. ඊට විනාඩි 05කට විතර පස්සේ තව දෙදෙනෙක් එතනට පැමිණියා. ඒ දෙදෙනාගෙන් එක් අයෙක් මට තර්ජනය කළා. උඹ එලියට බහින්න එපා උඹ ටවුන් එකේ දණ ගස්සනවා. ටවුන් එකේ බඩ ගාවනවා. උඹව මරනවා කියා. ඊට පස්සේ ඔහු ඇතුලට ඇවිත් මට පයින් ගැහුවා. ඉන් පසු තුසිත මල්ලී ඇවිත් ගහන්න එපා කියා එලියට දාන්න යද්දී අනෙක් නෙත් ගේට්ටුවෙන් ඇතුළට ආවා. ඔහු මට මොකුත් කිව්වේවත්, ගැහුවේවත් නෑ. ඔහු ඒ එක්කටම එළියට ගියා. දෙදෙනාම එළියට දමා අපි ගේට්ටුව වැසුවා. පසුව ඒ එක්කම නොච්චියාගම පොලිස් ස්ථානයට අපි කෝල් එකක් දුන්නා. කට්ටියක් බීලා ඇවිල්ලා අපිට ගහනවා කියලා. ඊට විනාඩි දෙක තුනකට පසුව පොලිස් ජීප් එක එතනට ආවා. ඒ පැමිණෙන විටත් පස්සේ ආව දෙන්නා ගේට්ටුව හොල්ල හොල්ලා එතැන සිටියා. ඒ දෙන්නා ජීප් එකේ දාගෙන පොලිසියට අරන් ගියා. ඉන්පසුව මා පොලිස් ස්ථානයට ගොස් මේ සම්බන්ධව පැමිණිල්ලක් දමා මා ඉස්පිරිතාලයට ගිහිල්ලා ඇඩ්මිට් වුනා. පස්සේ ආව දෙන්නා මම කලින් දන්නේ නැහැ. පස්සේ ආරංචි වුනා මට පයින් ගහපු කෙනා දිනේෂ් කියලා. අනෙක් කෙනා විමල්සිරි කියලා. "**

එසේම එම අවස්ථාවේ එම ස්ථානයේ සිටි සිවිල් නිලධාරී ඒ.තුසිත රවීන්ද්‍ර ආරච්චි යන අයගේ ප්‍රකාශය මඟින් සිසිර යන අයගේ ප්‍රකාශය තවදුරටත් තහවුරු කරයි.

**"මම ඇතුලේ ඉන්න කොට සිසිර අයියා මගේ නම කියලා තුන් සැරයක් ඉක්මනට එන්න කියලා කතා කරා. මම එනකොට දෙන්නෙක් සිසිර අයියාට**

**ගහනවා. ඊට පස්සේ මම මැදට පැනලා ඒක බේරලා ඒ දෙන්නාව එළියට දාලා ගේට්ටුව වැහුවා. ඊට පස්සේ ඒ දෙන්නා ගියා.ඊට විනාඩි පහකට විතර පස්සේ තව දෙන්නෙක් ආවා. ඒ හිටපු දෙන්නාගෙන් එක්කෙනෙක් අමුණුකොලේ දිනේෂ් යන අය. මම එයාව කලින් දන්නවා. අනික් කෙනා මම දන්නේ නැහැ. පස්සේ දැනගත්තා එයා එස්.ටී.එෆ් එකේ සාජන් රත්නායක කියලා. දිනේෂ් සිසිරට අතින් එකක් ගැහුවා. ඒක සිසිරට වැදුනේ නෑ. විමල්සිරි ඒ වෙලාවේ සිසිරට මොකුත් කිව්වේ නෑ. දිනේෂ්ට යමු කියලා කිව්වා. ඊට පස්සේ මම ඒ ගොල්ලන්ට එලියට යන්න කියපුවම එයාලා එලියට ගිහිල්ලා ගේට්ටුව ගාව හිටියා. මම මගේ ෆෝන් එකෙන් පොලීසියට කෝල් එකක් අරන් සිසිර අයියාට දුන්නා. ඊට පස්සේ පොලිස් මොබයිල් එක ඇවිල්ලා ඒ දෙන්නාව අරගෙන ගියා. මම උසාවියේ දිගටම හිටියා. සිසිර අයියා පොලීසියට ගියා. මා හට කීට ඇත්තේ මෙපමණයි."**

ඇමුණුම් 3 මගින් ඉදිරිපත් කර ඇති විමර්ශන නිලධාරීගේ වා ර්තා වේ නිගමන කොටස ද වැදගත් බව පෙනී යයි.

**"මෙම සිදුවීම සිදුවන අවස්ථාවේ දී පො.සැ.37441 විමල්සිරි රත්නායක යන අය බීමත්ව සිට ඇති අතර, නොච්චියාගම ගරු සංචාරක මහේස්ත්‍රතාත් අධිකරණ භූමියට අයුතු ඇතුල්වීමක් සිදුකර ඇත. ඒ අනුව පොලිස් සේවයට** අපකීර්තිදායක **අන්දමින් හැසිරී ඇතත් උඩුපිලගේ සිසිර කුමාර යන අයට තර්ජනය කිරීමට හෝ පහරදීමට සම්බන්ධ වී නොමැත."**

එසේම ඇමුණුම 7 මගින් 2017.06.28 දින සාමවිනිසුරු එස්.එන්.එච්.කේ.තෙන්නකෝන් ඉදිරියේ දී පැමිණිලිකරු වන උඩුපිලගේ සිසිර කුමාර යන අය දිව්රුම් ප්‍රකාශයක් මගින් ද මෙම අභියාචකගේ නිර්දෝෂීභාවය සහතික කර ඇත.

ජාතික පොලිස් කොමිෂම 2023.12.29 දින ලිපියේ 6 ඡේදයේ

**“II පහරකෑමට ලක්වූ මහේස්ත්‍රාත් අධිකරණයේ මුරකරු වන යූ.සිසිර කුමාරගේ සාක්ෂිය අනුව චූදිත පොලිස් සැරයන් ඔහුට පහරදීමක් සිදුකර නොමැති බවත්, චූදිත සමග ගිය අනෙක් පුද්ගලයා වන දිනේෂ් නැමැති අය විසින් ඔහුට පහර දුන් බවටත් ප්‍රකාශ කර ඇත.**

**III. මෙදින අධිකරණ භූමියේ මුරකරුගේ සහායට සිටි සිවිල් ආරක්ෂක භට 81179 තුසිත ආරියරත්නගේ සාක්ෂිය අනුව පහරදීමට පැමිණි අය අතර චූදිත නිලධාරිය ද සිටි බව තහවුරු වේ.**

**IV. විධිමත් විනය පරීක්ෂණයේ දී ඉදිරිපත් වූ සාක්ෂි අනුව චූදිත විසින් මුරකරුට පහර දී නැතත් අධික ලෙස බීමත්ව අනවසරයෙන් අධිකරණ භූමියට කඩා වැදී අපහාසාත්මකව වචන පාවිච්චි කරමින් හැසිරී ඇති බව සනාථ වී ඇති අතර, නොච්චියාගම ප්‍රාදේශිය රෝහලේ වෛද්‍ය නිලධාරී විසින් නිකුත් කරන ලද අංක 287/17 දිරණ අධිකරණට වෛද්‍ය පෝරමය අනුව ‘*කටින් මත්පැන් ගඳ වහනය වේ’* යනුවෙන් සඳහන් කර තිබීමෙන් මෙහු මේ අවස්ථාවේ බීමත්ව සිටි බවට තහවුරු වන බවද නිරීක්ෂණය කරමි.”**

මේ අනුව අභියාචක සිසිර යන අයට පහරදීමක් හෝ බැන වැදීමක් සිදුකර නැති වුවත්, එම ස්ථානයේ සිටි බව ඔප්පුවේ.

දඬුවම් ලබාදීමේ දී මුලින් සඳහන් වරද මෙයට වඩා බරපතල වූවක් වන අතර, ඒ සඳහා ලබා දි ඇති දඬුවම සුළු එකකි. ජාතික පොලිස් කොමිෂම එම දඬුවම ද අඩුකර ලිහිල් කර ඇත. ඒ් අනුව දෙවන සිද්ධියේ වරද ඊට වඩා යම් ප්‍රමාණයක පහල වුවද, එය පැහැදිලිව ඔප්පු වීමක් ද සිදුවී නැති අවස්ථාවක ඒ සඳහා ලබා දී ඇති දඬුවම එය සේවයේ දරමින් සිටින තනතුරෙන් පහත තනතුරකට පත් කිරීම ප්‍රමාණාත්මකව වැඩි බව විශ්වාස කරමි.

කෙසේ වුවද පොලිස් නිලධාරියෙකු සැම විටම අන් අයට ආදර්ශවත් පුද්ගලයෙකු විය යුතුය. නීතිය හා සාමය ආරක්ෂා කිරීමට සැම විටම බැඳී සිටී. මෙම ක්‍රියාව තුළින් පොදුවේ පොලිස් සේවාව හා දෙපාර්තමේන්තුව අපකීර්තියට ලක්වීම සිදුවී ඇති බව පැහැදිලි වේ. ලබා දී ඇති දඬුවම වරදේ ස්වභාවය අනුව ප්‍රමාණාත්මකව වැඩි නිසා ඒ සංශෝධනයට එකඟ වෙමි.

ඉහත කරුණු අනුව අභියාචනයේ සඳහන් "**ඇ**" ඉල්ලීම අනුව අභියාචක දරමින් සිටි පොලිස් සාජන් තනතුරේ පිහිටුවීමට නිර්දේශ කරමු.

අභියාචනයේ "**ආ**" සඳහන් IV ඉල්ලීම 2016.12.13 – 2017.05.21 දක්වා හිඟ වැටුප් හා දීමනා ලබාදෙන ලෙස වන ඉල්ලීම මෙම සිදුවීමට අදාළ කාලය තුල සිදුවී ඇති දෙයක් නොවන බැවින්, මෙම වැඩ තහනම සිදුවී ඇත්තේ 2017.06.09 දින නිසා එම ඉල්ලීම ප්‍රතික්ෂේප කරමු.

ඉහතින් සඳහන් කළ පරිදි පොලිස් සේවයේ කීර්ති නාමය ආරක්ෂා කිරීමට සහ අනිකුත් නිලධාරීන්ට ආදර්ශයක් වන පරිදි අදාළ වරද සිදුකළ දින සිට මෙම වරද සඳහා වැටුප් වර්ධකයක් විලම්භනය කිරීමටද තීරණය කරමු.

ඉහත කොන්දේසි වලට යටත්ව අභියාචනයට ඉඩ ලබාදෙමු.

මෙම නියෝගයේ පිටපත් අභියාචක, පොලිස්පති හා ජාතික පොලිස් කොමිෂම වෙත නිකුත් කරන්න.

ජේ.ජේ.රත්නසිරි
(සාමාජික)

මම එකඟ වෙමි

කේ.ටී. චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි

එස්.නන්දසේකරන්
(සාමාජික)

ල/-